City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත
කලාපය 04
2023 පෙබරවාරි 01




# මෙම වසරේ දී පූජා භූමි 26ක් ගැසට් කිරීමට සැලසුම්

පිටුව 02

පාට පාට මල් යායක — මදහස
සම සිතකින් විඳිනට පා — සෙනෙහස
බෙද අඳුරු ඝණ තිමිර වළා — පිස
බදා වැළඳ ගමු සතුටින් — නිදහස

# සියනෑවට නව අරුණැළු

පිටුව 05

# සාගරයම හැඬවූ X PRESS PEARL

පිටුව 07



එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර නිසා මෙරට සාගර පරිසරයට වූ හානියට වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් සොයා බැලීමට පත්කළ විශේෂඥ කමිටු වාර්තාව පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිනී නීතිඥ දර්ශනී ළහඳපුර මහත්මිය විසින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග සහ රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු යන මහත්වරුන්ට පිළිගැන්වූ අවස්ථාව.

පිටුව 07




# නාගරික සංවර්ධනයෙන් රට නව මාවතකට

පිටුව 03

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ City News නිළ ඊ පුවත්පත සඳහා පිවිසෙන්න

# උතුරේ වකුගඩු රෝගය මට්ටු කරන්න නැනෝ ජලය



පිටුව 04

# කතු වැකිය

අප රට කෘෂිකර්මාන්තයෙන්, කර්මාන්තයෙන් දියුණු කළ හැකිය.
ආහාර අපනයන කළ අභිමානවත් ඉතිහාසයක් අපට හිමිය.
එපමණක් නොව රෙදි පිළි, ටයර්, සීනි, වානේද අපිම නිපදවා ගත්තෙමු.
නමුත් අද සියළුම දෙය පිටරටින් ආනයනය කරන විනිළුකාරයන් බවට පත්ව සිටිමු.
දුක, සොම්නස, පීඩනය උපරිමයෙන් දොරේ ගලා ගිය පසුගිය වසරේදී
මිනිසුන් වශයෙන් අප ලැබූ පරාජයන් හා උගත් පාඩම් බොහෝය.
දැන් අවැසි වන්නේ පරාජය ජයග්‍රහණයක් බවට පත්කර ගැනීමයි.
අතීතයට බැණ වැදීමෙන් ඵලක් නැත.
අනාගතය වෙනුවෙන් පෙළ ගැසෙමු.

**උපදේශකත්වය**
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

**සංස්කරණය**
අමිල දර්ශන හේරත්

**පිටු සැකසුම**
ධනුෂිකා කුමාරි

**විශේෂාංග ලිපි**
නාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්

**සෝදුපත් බැලීම**
පී.බී.එස්. සම්පත්

**සම්බන්ධීකරණය**
දිලිනි කෞෂල්‍යා
නදුන් තාරක
නිලංක නිරෝෂන්

**ඡායාරූප**
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ

**පරිගණක සහය**
සචිදු සංකල්ප
තිළිණ නිර්මාල්

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com

## මෙම වසරේදී පූජා භූමි 26ක් ගැසට් කිරීමට සැලසුම්...

මෙම වසරේදී පූජා භූමි 26ක් ගැසට් කිරීමට සැලසුම්කර ඇතැයි ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

ඒ අනුව තිස්සව රජමහා විහාරය, වෙල්ගම් වෙහෙර රජ මහා විහාරය, මහසෙන් රජ මහා විහාරය, මැදගොඩ සිද්ධ පත්තිනි දේවාලය, බියගම සුධර්මාරාම මහා විහාරය, පැපිලියාන සුනේත්‍රා මහාදේවි පිරිවෙන, කඹලෑව ඇඹව ශ්‍රී සුධර්මාරාමය, පිලාකටුමුල්ල ශ්‍රී පුෂ්පාරාම පුරාණ විහාරය, කිරිමැටියාන ශ්‍රී සුධම්මවංශාරාම රජමහා විහාරය, කප්පින්න මහා විහාරය, මාගල්ල කච්චිවත්ත පුරාණ රජ මහා විහාරය, බුද්ධියාගම සීගල රජ මහා විහාරය, ගංගොඩවිල ශ්‍රී විජයාරාම විහාරය, රත්මලාන පුෂ්පාරාමය, අස්ගිරිය පුරාණ රජ මහා විහාරය, මදුරාවෙල බැල්ලපිටිය විද්‍යාසේකර පිරිවෙන, පොතුවිල් මුහුදු මහා විහාරය, මහසෙන් රජ මහා විහාරය, බුදුරුවයාය රජ මහා විහාරය, ඓතිහාසික පුරාණ හබරණ ටැම්පිට විහාරය, සෝමාවතිය රජමහා විහාරය, කන්දෙගම ධංනජය රජ මහා විහාරය, කන්දෙගම නාමළුව සිංහගිරි රජ මහා විහාරය, බිබිල ඓතිහාසික කොටසර පියංගල රජමහා විහාරය, මාතියම්ගම රජ මහා විහාරය එලෙස පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.

> "පසුගිය වසරේදී පූජා භූමි 16ක් ගැසට් කර අවසන්..."

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සඳහන් කරන්නේ පසුගිය වසරේදී පූජා භූමි 16ක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති බවය අරිසිමලය රජමහා විහාරය, නාගලෙන රජ මහා විහාරය, බඹරගල ආරණ්‍ය සේනාසනය, ඇතා නැගි කන්ද රජ මහා විහාරය, සංබමලේ පුරාණ රජ මහා විහාරය,අම්පාර පියංගල රජ මහා විහාරය, මඟුල් මහා විහාරය, නාගදීප රාජ මහා විහාරය, කුරගල රජමහා විහාරය, ගිරිවුල්ල මැද්දේපොළ රජ මහා විහාරය, නිකසලානුවර රජ මහා විහාරය, හුණුපිටිය ගංගාරාම විහාරය, කොටහේන පරාමානන්ද විහාරය, කෑරගල පත්මාවතී පිරිවෙන් විහාරය, ලුණුගම සිරි පැරකුම් විහාරය, මහියංගනය රජ මහා විහාරය ඉකුත් වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති පූජා භූමි වේ.

> "ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති සමස්ත පූජා භූමි ගණන 101 යි..."

මේ වනවිට මෙරට පූජා භූමි 101 ක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර තිබේ. 1961 ඔක්තෝම්බර් 16 දින කතරගම මෙරට පළමු පූජා භූමිය ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර පසුගිය මාසයේ 23 වැනිදා මෙරට 101 වැනි පූජා භූමිය ලෙස මහියංගනය රජ මහා විහාරය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කෙරිණ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දෙන්නේ පූජා භූමි ප්‍රකාශයට පත් කිරීමේදී නිර්ණායක 03 ක් අනුව එය සිදු කෙරෙන බවයි. ජාතික වශයෙන් කාලපීය වශයෙන් හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් වන ස්ථාන මෙලෙස තෝරා ගැනේ.

පූජා භූමි ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස මේ වනවිට ලැබී ඇති ඉල්ලීම් අධ්‍යයනය කරමින් ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ අංශ වෙත දැනටමත් උපදෙස් දී ඇති බවද ඔහු පෙන්වා දෙයි. පූජා භූමි ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මෙන්ම බුද්ධ ශාසන අමාත්‍යාංශ අනුමැතියද මිනින්දෝරු සැලැස්මද ඊට අත්‍යාවශ්‍ය බව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පවසයි.

නාලක සංජීව දහනායක

# නාගරික සංවර්ධනයෙන් රටට නව මාවතක්

රටක සංවර්ධනයේදී කැපී පෙනෙනම අංශය නාගරික සංවර්ධනයයි. 2010 පටන් 2015 ජනවාරි දක්වා මෙරට නාගරික සංවර්ධනය ශීඝ්‍ර දියුණුවක් ලබා ගත්තේය. එකල ආසියාවේ සුන්දරම නගරය මෙන්ම වේගයෙන්ම දියුණුවෙන නගරය බවට කොළඹ නගරය පත්වීම මෙරට නාගරික සංවර්ධනයේ "ලැන්ඩ් මාර්ක්" එකක් විය.

කොළඹ කසළ බැහැර කිරීමේ ප්‍රශ්නය නිරාකරණය කර දුගඳ හමන කොළඹ නගරය එකල පිරිසුදු නගරයක් කළේය. නගර අලංකරණය මෙන්ම ඇවිදින මංතීරු ඇති කළේ ජනතාවගේ සෞඛ්‍යය කෙරෙහි ද අවධානය යොමු කරමිනි. කොළඹ නගරය තුළ ළමා උද්‍යාන ඇති කළේය. කොළඹ ගංවතුර පාලනයට පියවර ගත්තේය. ගරා වැටී තිබූ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කොට ඒවා ව්‍යාපාරික ස්ථාන බවට පත් කළේ නාගරික සංවර්ධනයේ කොටසක් වශයෙනි. කොළඹ ලන්දේසි රෝහල මෙන්ම ෆෝලෝටීන් මාර්කට් එයට උදාහරණය. සිංගප්පූරුව, ක්වාලාලම්පූර්, ජකාර්තා ආදී නගර පරාජය කරමින් වේගයෙන්ම දියුණු වන නගරය ලෙස කොළඹ නගරය 2015 දී සම්මානයට පාත්‍ර වූයේ මේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙනි. නගර අලංකරණය කොළඹට සීමා කළේ නැත. ගාල්ල, නුවර, කුරුණෑගල, යාපනය, මඩකළපුව ආදිය උදාහරණ වශයෙන් පෙන්නාදිය හැකිය. ලංකාවට කීර්තියක් ලැබුණෙත් නාගරික සංවර්ධනයක් ඇති වූවෙත් 2011 සිට 2014 දක්වා කාලයේය.

අප රට මැදි ආදායම් ලබන දියුණු වෙමින් පවතින රාජ්‍යයකි. එහෙත් සංවර්ධනය එක් මාවතකට පමණක් සීමා කළ නොහැක. සංවර්ධනය කරා යන ගමනේදී ඒ රට විවිධ ක්ෂේත්‍රයන්ගෙන් සංවර්ධනය විය යුතුය. ලොව ජනගහනයෙන් අඩකටත් වඩා වැඩි පිරිසක් ජීවත් වන්නේ නාගරික පරිසරය තුළය. 2030 වන විට ලෝක ජනගහනයෙන් 60% නාගරික ජනතාව විය හැකි බවට පුරෝකථනය කර තිබේ. මෙය අප රටටද පොදු තත්ත්වයකි.

මේ හේතුවෙන් අවිධිමත් ජනාවාස, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, නිවාස හිඟකම, දේපල අයිතියේ ගැටළු, වාහන තදබදය, වායු දූෂණය, පාරිසරික දූෂණය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක්ෂාව, රැකියා හා භූමිය සීමිත වීම වැනි ගැටළු රැසකට ලෝකයට මුහුණ දීමට සිදුවේ. කොතරම් තීරණාත්මක වුවද රටේ ජනතාවගේ යටිතල පහසුකම් හා සංවර්ධනය අඩාල කළ නොහැක.

නාගරික සංවර්ධනය හා නිවාස යනු වෙන් වෙන් වූ ක්ෂේත්‍ර දෙකක් ලෙස පෙනුනද එම ක්ෂේත්‍ර දෙකම එකකි. එය රටේ දියුණුවට විශාල දායකත්වයක් සේම සේවයක් සපයන ආයතනයකි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ දැක්ම වන්නේ නව නගර හා සැමට නිවාස යන සංකල්පයයි.

භෞතික අවකාශයේ නව ප්‍රවේශයක් හරහා ආර්ථික කේන්ද්‍රස්ථානයක් වශයෙන් මෙන් ම, සුවපහසු, සුපිරිසිදු නගර ඇති කිරීම සහ ජනතාවට අවැසි නේවාසික හා නාගරික පහසුකම් ලබා දීම අරමුණු කර ගනිමින්, 2022 ජුලි 22 දින අංක 2289/43 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පිහිටුවන ලදි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ විෂය පථය යටතේ දෙපාර්තුමේන්තු ව්‍යවස්ථාපිත ආයතන, සංස්ථා ඇතුළු ආයතන 21 ක් ඇතුලත්ය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට,

- **වැඩිදියුණු කළ නාගරික යටිතල පහසුකම් සහ සේවාවන් සහිත නගර.**
- **කොළඹ අගනගරය ගංවතුරෙන් තොර නගරයක් බවට පත් කිරීම.**
- **පැල්පත්වාසීන්ට ස්ථිර නාගරික නිවාස අත්කර දීම.**
- **සැලසුම්ගත ලෙස නගරය සහ රට සංවර්ධනය කිරීම.**
- **අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින රාජ්‍ය අමාත්‍යාංශ සඳහා කාර්යක්ෂම ප්‍රතිපත්තිමය මඟපෙන්වීම හා එම අමාත්‍යාංශ සුපරීක්ෂණය සහ අධීක්ෂණය.**
- **ජාතික ප්‍රමුඛතාවන්ට අනුව ජාතික භෞතික සැලැස්ම යාවත්කාලීන කිරීම.**
- **කලාපීය සැලසුම් සකස් කිරීම.**
- **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඇතුළු ප්‍රතිපත්තිමය ලේඛන කාර්යක්ෂම ව ඉදිරිපත් කිරීම.**
- **කාර්යක්ෂම අධීක්ෂණ සහ තොරතුරු හුවමාරු කරගැනීමේ පද්ධතිය.**
- **ව්‍යාපෘති සහ වැඩසටහන් සුපරීක්ෂණය.**

ආදී ඉලක්ක රැසක් හිමිව තිබේ. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා වත්මන් රජය යටතේ එම ඉලක්ක කරා යාමේ අභියෝගය සියතට ගෙන තිබේ.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මුළු ලෝකයේම සමාජ මෙන්ම ආර්ථිකයට විශාල බලපෑම් රැසක් එල්වූ බව නොරහසකි. එය ලෝකයේ ප්‍රභලතම රටවල්වලට පවා බෙහෙවින් බලපෑවේය. එය අප රටටද ඒ අයුරින්ම බලපෑවේය. එයින් එල්ල වූ බලපෑම හේතුවෙන් රටේ සංවර්ධන වැඩසටහන් සියල්ල අතරමග නතර කරන්නට සිදුවිය. ඒ සමඟම අද මෙරට ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටියි. එම සියළුම ගැටළු වලට මුහුණ දෙමින් රට සංවර්ධනය කරා යාමේදී අප අමාත්‍යාංශයට විශාල වගකීම් රැසක් පැවරේ.

අතීතයේ පටන්ම සිහිනයක්ව පැවති කොළඹ වරාය නගරය හෙවත් පෝර්ට් සිටියද මේ වනවිට සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතී. එහි ජාත්‍යන්තර පාසලක්, ජාත්‍යන්තර රෝහලක්, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවක්, ජාත්‍යන්තර හෝටලයක් ආරම්භ කිරීමට සැලසුම් සකසා ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණවීමෙන් පසුව ඉදිරියේදී මෙරට සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය බවට පෝර්ට්සිටිය පත්වනු ඇතැයි අනුමාන කළ හැකිය.

පශ්චාත් කොවිඩ් අර්බුදය හා රට මුහුණදී තිබෙන ආර්ථික අර්බුද හේතුවෙන් තාවකාලිකව නතරව තිබූ බොහෝ සංවර්ධන ව්‍යාපෘති මේ වනවිට යලි ආරම්භ කිරීමට පියවර ගෙන ගනිමින් සිටින මොහොතකි මේ. ඒ සඳහා විෂය භාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් දැනටමත් විශේෂ වැඩපිළිවෙලක් සකසා නිළධාරීන්ට අවශ්‍ය උපදෙස්ද ලබාදී තිබේ. එබැවින් අනාගතය එතරම් අඳුරු නොවනු ඇත. සුබවාදීව අනාගතය දෙස බලා සිටිමු.








/අමිල දර්ශන හේරත්

# උතුරේ වකුගඩු රෝගය මට්ටු කරන්න නැනෝ ජලය

## නැනෝ තාක්ෂණයෙන් යුත් ජල පිරිපහදු යන්ත්‍රාගාර 50ක්..

අප රටෙහි බෝවන රෝගවලට වඩා බෝ නොවන රෝග ව්‍යාපතියේ අවධානම වැඩිය. පුද්ගල මරණ ප්‍රතිශතය ඉහළ යාමට ප්‍රධානම හේතු කාරකය ලෙස මෙම බෝ නොවන රෝග පෙන්නා දිය හැකිය. ඒ අතුරින් වකුගඩු රෝගය ප්‍රධානය. වකුගඩු රෝගයට ගොදුරු වන පිරිසද දිනෙන් දින ඉහළ යමින් පවතී.

උතුරු මැද, උතුරු හා නැගෙනහිර පළාත්වල වකුගඩු රෝගීන් වාර්තාවීම අතිශයින්ම ඉහළ අගයක් ගනී. මෙරට උතරු මැද පළාතේ පැතිරී යන වකුගඩු රෝගය (CKDU) සෑදීමට හේතු වී තිබෙන්නේ ජලයේ පවතින ෆ්ලෝරයිඩ්, කැඩ්මියම් සහ දෘඪතාවය (කිවුල) යන සංඝටක තුනම එකම අයුරින් පිහිටා ක්‍රියාකිරීම බව ඒ සම්බන්ද විද්වතුන් සඳහන් කරයි.

මෙතෙක් ජලයේ මිශ්‍රව පවතින ආසනික්, කැඩ්මියම්, ඇලුමිනියම් වැනි බැර ලෝහවල අධික සාන්ද්‍රණයන් හඳුනා නොගත් වකුගඩු රෝගය සඳහා හේතු වේ යැයි අනුමාන කළහ. විශේෂයෙන්ම රසායනික පොහොරවල අඩංගු කැඩ්මියම් නිසා පමණක් බව ප්‍රචලිතව පැවති මතය මේ සමඟ බැහැර කිරීමට සිදු වේ.

දිවයින පුරා වකුගඩු රෝගීන් ව්‍යාප්තියට තිත තැබීමට පිරිපහදු ජලය ඉමහත් රුකුලක් සපයයි.

විශේෂයෙන්ම උතුරු පළාතේ වකුගඩු රෝගය පාලනය කර එම ප්‍රදේශවල ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳීමට නැනෝ ජල පිරිපහදු යන්ත්‍රාගාර 50ක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි එම අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක නැවත පදිංචි කිරීමේ අංශය, ප්‍රජා ජල දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියාත්මක කර තිබේ. එමෙන්ම මේ සඳහා පුද්ගලික අංශයද සම්බන්දකරගෙන ඇත.




ඒ අනුව මුලතිව් දිස්ත්‍රික්කයේ නැනෝ ජල පිරිපහදු යන්ත්‍රාගාර 4ක් ස්ථාපිත කෙරෙන අතර, කිලිනොච්චි හා වව්නියාව දිස්ත්‍රික්කවල නැනෝ ජල පිරිපහදු යන්ත්‍රාගාර 23 බැගින් ස්ථාපිත කිරීමට නියමිතය.

J-AQUA නැනෝ තාක්ෂණික ජල පිරිපහදු පද්ධතියක් වන Nano Filtration (NF) ජල පවිත්‍රකරණය සඳහා යොදා ගනියි. Nano Filtration (NF) යනු පටලමය ආකාරයට ජලය පිරිපහදු කරන පද්ධතියකි. මේ මගින් ඉහළ සංයුජතාවකින් යුත් ලවණ වර්ග හෝ ද්විසංයුජමය මූලද්‍රව්‍ය ඉවත් කරයි. නමුත් සෝඩියම් ක්ලෝරයිඩ් වැනි ඒකසංයුජමය ලවණ වලට ඒ හරහා යාමට හැකියාව පවතී. ප්‍රධාන වශයෙන් මෙම NF පටලය කාර්මීකරණ යෙදවුමක් ලෙස ජලයෙහි ඇති ඝණත්වය අඩු කිරීමට යොදා ගනියි. NF පිරිපහදු ක්‍රමය වඩාත් ගැළපෙනුයේ ජලයේ ද්‍රවිත ස්ඵතික ප්‍රමාණය (TDS) 1500ppm ට වඩා අඩු ඕනෑම ජල මූලාශ්‍රයක් සඳහා ය. තවද නැනෝ පිරිපහදු මගින් විෂ ද්‍රව්‍ය, බැර ලෝහ සහ අනෙකුත් කාබනික සංයෝග බැහැර කර ජලයෙහි දුගඳ හා රස ඉවත් කරයි.




මෙම නැනෝ ජල පිරිපහදු යන්ත්‍රාගාරයක් මගින් දිනකට ජලය ලීටර 2000ක් පමණ පිරිසිදු කිරීමේ හැකියාව පවතින බවද නැවත පදිංචි කිරීමේ ඒකකය පවසයි.

2021 වසරේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 209කි.නාගරික සංවර්ධන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක නැවත පදිංචි කිරීමේ ඒකකය සඳහන් කරන්නේ මෙම ව්‍යාපෘතියේ සියයට 60ක පමණ ඉදිකිරීම් කටයුතු අවසන් බවයි.

දුරාතීතයේ මෙරට පැවති පරිසර හිතකාමී ගොවිතැනට කණකොකා හැඬුවේ අපි රසායනික පොහොර භාවිතයට හුරුවීමත් සමඟය. පරිසරයට මෙන්ම මිනිස් ජීවිතවලට ඉන් විශාල බලපෑමක් සිදු වූ අතර පිළිකා, වකුගඩු වැනි රෝග රැසක් මෙරට තුළ ව්‍යාප්තවීමට එය බලපෑවේය. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ රසායනික පොහොර තහනම් කිරීමට පියවර ගත්තේ එබැවිනි. එම තීරණය ක්‍රියාත්මක කිරීමේදී සමාජයේ යම් ප්‍රශ්නාර්ථයක් මතු වුවත් හිටපු ජනාධිපතිවරයා එම තීරණය සද්භාවයෙන් ගත් තීරණයක් බව පැහැදිලිය.

ඒ කෙසේ වෙතත් මේ වනවිට ලොව රටවල් රැසක් රසායනික පොහොර භාවිතයෙන් ක්‍රමයෙන් ඈත් වෙමින් සිටී. නමුත් අපි?.








/ නාලක සංජීව දහනායක

# සියනෑවට නව අරුණාලු

සංවර්ධනය යනු රටකට අවශ්‍යම දෙයකි. එහිදී රටේ අමාත්‍යාංශ වලට පැවරෙන කාර්ය භාරය අතිමහත්ය. මෙරට සංවර්ධනයට දායක වන ප්‍රධාන අමාත්‍යාංශ කිහිපයකි. ඒ අතරින් නාගරික සංවර්ධන හා නිවාස අමාතංශයට ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ. එය රටේ සංවර්ධන කාර්යයට උර දෙන ප්‍රධානතම අමාත්‍යාංශ-යකි.

පසුගිය සමය තුළ පැවති කොරෝනා වසංගතය සහ රට මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ රටේ සංවර්ධනය අඩාල විය. නාගරික සංවර්ධන හා නිවාස අමාතංශයේ සංවර්ධන කටයුතුද කලකට නතර කිරීමට සිදු විය. නමුත් දැන් නැවත රට නිසි මාවතට පැමිණෙමින් තිබේ. ඒ සමගම රටේ සංවර්ධන කටයුතු නැවත පටන් ගෙන ඇති අතර නාගරික සංවර්ධන හා නිවාස අමාතංශයද සිය සංවර්ධන කටයුතු යළි පටන් ගෙන ඇත.

නාගරික සංවර්ධන හා නිවාස අමාතංශයේ විෂය පථය ඉතා විශාලය. ඉන් නගර සංවර්ධන කටයුතු සහ නිවාස ඉදිකිරීමේ කටයුතු ප්‍රමුඛ වේ. පසුගිය කාලය තුළ මෙම කටයුතු අඩාල වු අතර නැවත එම කටයුතු ආරම්භ කර ඇත. මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු ද නැවත ආරම්භ කර ඇත. ඒ අතරට වැඩ නතර කොට තිබූ ව්‍යාපෘති සේම නව ව්‍යාපෘති ද වේ.

සියලුම අධිවේගී මාර්ග එකිනෙකට සම්බන්ධවන කඩවත නගරය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය තීරණය කර තිබේ. ඊට හේතු වී ඇත්තේ අධිවේගී මාර්ග පද්ධතිය සම්බන්ධ කෙරෙන ප්‍රධාන ස්ථානය කඩවත නගරය වීමයි. එම අරමුණින් ආරම්භ කරන ලද කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ වැඩ කටයුතු මේ වනවිට වැඩ අවසන් කර ඇත.

මෙම බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රජය වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 377 කි. 2019 වසරේ මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 2021 වසරේ මෙහි ඉදිකිරීම් අවසන් කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක මෙය ඉදිකර තිබේ.

මෙහි බස්රථ 25 ක් පමණ ගාල් කළ හැකි බස් රථ පර්යන්තයක්, කාර්යාලීය වාහන නතර කළ හැකි රථ ගාලක් සහ නවීන පන්නයේ ආපන ශාලාවක් ඉදිකර ඇත. එමෙන්ම මෙහි නව උමං මාර්ගයක් ද ඉදිකර ඇති අතර ඒ දෙපස කඩ කාමර 18 ක් ඉදිකර ඇති අයුරු දක්නට ලැබේ.

පසුගිය කාලයේ රට මුහුණ දුන් කොරෝනා වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් මෙය විවෘත කිරීමට නොහැකි වී තිබේ. නමුත් මේ වසරේදී කඩිනමින් එය ජනතා අයිතියට පත් කිරීමට  නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය තීරණය කර ඇත. එමගින් මෙරට ජනතාවට නුදුරේදීම මෙහි පහසුකම් ලබා ගැනීමට හැකි වනු ඇත.

ගම්පහ නව පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ද මේ දිනවල සිදු කෙරෙමින් පවතී.















2021 වසරේ සැප්තැම්බර් මාසයේදී මෙහි ඉදිකරීම් ආරම්භ කළ අතර පසුගිය කාලය තුළ රටේ පැවති තත්ත්වය හමුවේ මෙහි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කෙරිණි. මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර තිබේ.

මෙම නව පොදු වෙළඳ සංකීර්ණය මහල් 3 කින් සමන්විතයි. ගම්පහ නගර සභාවට අයත් ගම්පහ නගර මධ්‍යයේ පිහිටි ඉඩමක මෙය ඉදිකෙරේ. මේ සඳහා රජය වැය කරනු ලබන මුදල රුපියල් මිලියන 518 කි.

2023 වසර අවසන් වීමට පෙර මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතයි.  මෙහි කඩ කාමර 150 ක් පමණ ඉදිකෙරෙන අතර ගම්පහ පැරණි පොදු වෙළඳ සංකීර්ණයේ කඩ හිමියන් සඳහා මෙහි කඩ කාමර ලබා දීමට නියමිතය.

යක්කල වික්‍රමාරච්චි විශ්ව විද්‍යාලය ආශ්‍රිතව ඉදිකෙරුණු විකුම් උයන ඇවිදින මංතීරුවේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර තිබේ.

නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් ඇවිදින මංතීරු ව්‍යාපෘතිය ලෙස නව ව්‍යාපෘතියක් 2021 වසරේදී ආරම්භ කළ අතර ඒ යටතේ දිවයින පුරා ඇවිදින මංතීරු ව්‍යාප-ෘති ආරම්භ කෙරිණි. මෙම ව්‍යාපෘතිය ද එලෙස ආරම්භ කරන ලද්දකි.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඇවිදින මංතීරුවේ ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති අතර ඒ සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියන 65 කි. මෙහි වාහන 30 ක් පමණ නතර කළ හැකි රථ ගාලක්ද ඉදිකර ඇත.

මෙම ව්‍යාපෘතිය ගංවතුර සඳහා බලපෑමක් ඇති නොවන ලෙස ඉදිකර ඇති බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පවසයි. මෙහි ආයුර්වේද මධ්‍යස්ථානයක් සහ එළිමහන් ආපන ශාලාවක් ද ඉදිරියේදී ඉදිකිරීමට සැලසුම් කර තිබේ.

මෙම ව්‍යාපෘතිය ගංවතුර සඳහා බලපෑමක් ඇති නොවන ලෙස ඉදිකර ඇති බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පවසයි. එම අමාත්‍යාංශය පවසන්නේ මෙවැනි ව්‍යාපෘති ආරම්භ කලේ සෞඛ්‍යය සම්පන්න, නිරෝගීමත් පුරවැසියන් සමාජයට බිහි කිරීමේ අරමුණින් බවයි.

මේ අතර රාගම, පේරලන්ද ඇවිදින මංතීරුවේ 3 වන අදියරේ ඉදිකරීම් කටයුතු මේ වසර තුළ කඩිනමින් අවසන් කරන ලෙස ප්‍රසන්න රණතුංග ඇමතිවරයා උපදෙස් ලබා දී ඇත.

පේරලන්ද ඇවිදින මංතීරුවේ පළමු සහ දෙවන අදියරවල ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර මේ සඳහා දැනට වැය කර ඇති මුදල රුපියල් මිලියන 208 කි.  නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව එක්ව මෙම ව්‍යාප-ෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. 3 වන අදියරේදී මෙහි ළමා උද්‍යානයක්, ආපන ශාලාවක් සහ එළිමහන් කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට නියමිතයි.

ඡායාරූප නලින් හේවාපතිරණ

නිහාර චාමික පෙරේරා

# නිදහසේ 75



"නිදහස ලබන විට මුළු අග්නිදිග හා දකුණු ආසියාවේ දියුණුම රට වීමේ අවස්ථාව ලංකාව හිමිකරගෙන තිබුණා. ලංකාවට හොඳ තේ කර්මාන්තයක් තිබුණා. හොඳ පරිපාලන සේවාවක් තිබුණා. ලෝක භාෂාවක් හා දක්ෂ මානව සම්පතක් තිබුණා. ජාතීන් අතර සමඟිය තිබුණා...."
මේ සිංගප්පූරු නායක ලී ක්වාන් යූ මහතා අපේ රට ගැන කළ ප්‍රකාශයකි. නිදහස ලබා ගතවූ වසර 75 පුරාවටම අප කළ කී දෑ සිංගප්පූරු නායකයාගේ මෙම ප්‍රකාශයේ මනාසේ අඩංගුව පවතී.

එබැවින් ගෙවී ගිය වසර 75 පුරාවටම අප කළ කී දෑ නිදහසේ මෙනෙහි කළ යුතුය. දැන් බිහිසුණු යුද්ධයක් අපට නැත. නිදහසේ එහා මෙහා ගමන් බිමන් යාමේ හැකියාවක් අපට ඇත්තේ ය. එහෙත් අපට උරුම වූ ශ්‍රේෂ්ඨ සදාචාරය හා සංස්කෘතිය දැන් අපට නැත. පිටරටට සහල් අපනයන කළ අප දැන් පිටරටින් සහල් ආනයන කරයි. යොධ ඇළ, පරාක්‍රම සමුද්‍රය විශ්මිත නිර්මාණයන් දැන් සිදුවන්නේ නැත. අපිට උරුම ශේෂ්ඨ සංස්කෘතිය දැන් අපිට නැත. ශක්තිමත් ආර්ථිකයක් නැත. එබැවින් නිදහස ලබා ගතවන මේ මොහොතේත් අපිට ජයගැනීමට තවත් බොහෝ දේ ඇත. මිනිසුන් සතුව නිදහස පවතින අවස්ථාවලදී රටක සංවර්ධනයද සිදුවන බව ප්‍රකට මතයකි. මිනිසුන් විඳින නිදහස ඔස්සේ යම් සමාජයක ආර්ථිකය විනිවිද බවකින් යුතුව ක්‍රියාත්මක වේ. එබැවින් පුරවැසියන්ට භාෂණයේ, සිතීමේ හා විමසීමේ නිදහස රටක සංවර්ධනයට සෘජුවම බලපායි.

" අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී - හිඟා කෑම බැරිතැන ගයා ලඟී මර ගී "

යනුවෙන් හෙළයේ මහා දාර්ශණිකයා වූ කුමාරතුංග මුනිදාසයන් වරක් සඳහන් කළේ එබැවිනි. මේවා එදාට වඩා වටින්නේ අදය.
නිදහස යනු සංවර්ධනයේ පාදමය යැයි නොබෙල් ත්‍යාගලාභී අමර්ත්‍යා සෙන් වරක් ප්‍රකාශ කළේය. ජනතාවට කර්මාන්ත ආදිය කරගෙන යෑමට සෙත සැලසීම පාලකයාගේ වගකීමයි. එමෙන්ම ජනතාව දිළිඳු බවින් නිදහස් කිරීමද රටක පාලකයාගේ වගකීමයි. කෙටියෙන් කිවහොත් සැබෑ නිදහස යනු රටක ආර්ථිකය ශක්තිමත් කිරීමයි. ශක්තිමත් ආර්ථිකයක් නොමැතිව රටක් සංවර්ධනය කළ නොහැක. අප මේ මොහොතේ අරගල කළ යුත්තේ රටෙහි ශක්තිමත් ආර්ථිකයක් බිහිකර ගැනීම සඳහායි. සෑම දෙයක්ම පිටරටින් ගෙනවිත් අපගේ උදරය පෝෂණය කරගැනීමෙන් නිදහසේ රටක් සංවර්ධනය කළ නොහැකිය.

දේශීය චින්තනයක් ගැන කතා කරමින් අප තවමත් යැපෙන්නේ විදේශාධාර මතය. අපි අපිම විකුණාගෙන කන මේ ආර්ථික ක්‍රමය වෙනුවට අපේම ආර්ථික ක්‍රමයක් සකසා ගත යුතුය. භේද පසෙකලා අතීතයේදී මෙන් සියලුම දෙනා එකට එක්විය යුතුය.

"පිටරට සළුව හෙළ ගත වට එතෙන තුරු
පිටරට සහල් නැව් මෙරටට ඇදෙන තුරු
පිටරට දෙන දෙයින් ලක්මව යැපෙන තුරු
ලද නිදහසක් ගැන අප සිතනු බොරු"

ඇඳුරාපොත හේරත් චන්ද්‍රසේන කවියා කළ ප්‍රකාශය ගැන සිත යොමු කරමින් අපේ ආර්ථිකයේ අඩු පාඩු හදාගෙන ඉදිරියට යා යුතුය. මහා පරිමාණයෙන් මුදල් වියදම් කර නිදහසේ උත්සවය සැමරුවාට වැඩක් නැත. සිංහ ලීලාවෙන් මහත් වූ ආදම්බරයෙන් ශේෂ්ට ජාතියක් වශයෙන් ජාත්‍යන්තරය ඉදිරියේ නැගී සිටීමට තරම්වූ හැකියාවක් අපට තිබිය යුතු ය. රටත් ජාතියක් වශයෙන් අප අඩුපාඩු තුරන් කර ඉදිරියට පැමිණිය යුතු ය. නොයෙසේනම් අප මෙතැනිනුත් පහළට වැටෙනු ඇත.

නාලක සංජීව දහනායක

# සාගරයම හැඬවූ X PRESS PEARL

මිහිපිට පවතින අනෙකුත් කිසිදු ප්‍රවාහන මාධ්‍යයකින් ගෙන යා නොහැකි අන්දමේ භාණ්ඩ තොගයක් නැව් මගින් ප්‍රවාහනය කළ හැකිය. ඒ අනුව ලෝකයේ ප්‍රවාහන මාධ්‍යයන් අතරින් විශාලතම භාණ්ඩ ප්‍රවාහන මාදිලිය නැව වේ.එබැවින් පෘථිවියෙන් හතරෙන් තුනක්ම වැහුනු සාගර ජලය කපාගෙන ඉදිරියට ඇදෙන නැව් ලෝ පුරා බඩු බාහිරාදිය ප්‍රවාහනයේ දී ඉටුකරන්නේ නොමඳ සේවයකි.

එහෙත් මේ නැව්වලින් සිදුවන සේවය ගැනහෝ, මහ මුහුදේ සුන්දතර්වය ගැන කතාවක් නොවේ. නැවක් නිසා මහ මුහුදත් හැඬවූ කතාවකි මේ.

නිශ්චිතවම කිවහොත් දිනය හරියටම 2021 මැයි මස 19 වැනි දා ය. එදින ඉන්දියාවේ හසිරා වරායට ගොස් එතැන් සිට ශ්‍රී ලංකාව බලා යාත්‍රා කරමින් තිබූ සිංගප්පූරුවේ ලියාපදිංචි එක්ස්ප්‍රස් පර්ල් නෞකාව නාවික සැතපුම් 9.5ක් දුරින් මුහුදේ නැංගුරම් ලා තිබුණේ කොළඹ වරායට ඇතුළු වීමේ අපේක්ෂාවෙනි. මෙහි නයිට්‍රික් ඇසිඩ් ටොන් 25ක් සහ වෙනත් රසායනික ද්‍රව්‍ය ද, රූපලාවන්‍ය ආලේපන සහිත බහාලුම් 1486ක් ද තිබිණි. මැයි මස 20දා නෞකාවේ කිසියම් අනතුරක ස්වභාවයක් ඇති බව එහි කාර්ය මණ්ඩලයට හැඟී ගොස් ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ වේලාවෙන් උදෑසන 10ට පමණ මෙහි පළමු අනතුරු ඇඟවීම ශ්‍රී ලංකා වරාය අධිකාරියට දැනුම් දී ඇත. ඒ, නෞකාවේ ඇති බහාලුම් කිහිපයක් තිබෙන ස්ථානය වෙනස් කිරීමට අවශ්‍ය බව පවසමිනි. කෙසේ වෙතත් කිසිදු හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් නොවීය.

මැයි 20දා ශ්‍රී ලංකා වේලාවෙන් මධ්‍යහ්න 12.00ට නෞකාවේ ගින්නක් හටගෙන ඇති බව පවසමින් පළමු වාර්තාව වරාය පාලන මැදිරියට එවන ලදී. එසේම ගින්න පාලනය කර ඇති බව ද නෞකාව විසින් දන්වන ලදී. එහෙත් සිදුවූයේ අනෙකකි. එකස්ප්‍රස් පර්ල් නෞකාවේ ගින්න ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිබුණි. එදින සිට  දින 13ක් තිස්සේ එක්ස්ප්‍රස් පර්ල් ශෝකජනක අන්දමින් පණ අදිමින් සිටියේය. නෞකාව ශ්‍රී ලංකාවේ මීගමු කලපුවට බටහිර දෙසින් ගිනි ගැනීමෙන් පසුව මුහුදේ ගිලී යෑමට පටන් ගත්තේය. නෞකාව සම්පූර්ණයෙන් ගිලී යෑමට පෙර හැකි තාක් දුරට ඇදගෙන යෑමට පියවර ගන්නා ලදී. එහෙත්, ජුනි 2දා එය අතහැර දැමීමට සිදු වූයේ නැවේ පසුපස මුහුදු පතුලේ ගැටීම හේතුවෙනි. නෞකාවේ ඉරණම එසේ විසඳිණි. එහෙත්, එතැන් පටන් ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියට ද ජලජ ජීවීන්ට හා ජන ජීවිතයට එල්ල වූ හානිය සුළුපටු නොවීය. මෙම නෞකා අනතුර අප රටෙහි සිදුවූ ලොකුම නෞකා අනතුරය.

එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර නිසා මෙරට සාගර පරිසරයට වූ හානියට වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් සොයා බැලීමට පත්කළ විශේෂඥ කමිටු වාර්තාව පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිනී නීතීඥ දර්ශනී ළහඳපුර මහත්මිය විසින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාට සහ රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතාට පසුගියදා පිළිගන්වනු ලැබීය.

මෙම විශේෂඥ කමිටුව නියෝජිතයන් 40 දෙනෙකුගෙන් සමන්විත වේ. එහි සම සභාපතිවරුන් ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ පශ්චාත් අධ්‍යයන අංශයේ පීඨාධිපති මහාචාර්ය අජිත් ද සිල්වා සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය ප්‍රශාන්ති ගුණවර්ධන යන මහත්ම මහත්මීන් කටයුතු කර තිබේ.

මෙම කමිටුව වසර එකහමාරක කාලයක් තිස්සේ නෞකා අනතුර සම්බන්ධයෙන් විවිධ අංශ ඔස්සේ පරීක්ෂණ සිදුකර මෙම වාර්තාව සකස් කර ඇත.

එහිදී අදහස් දක්වමින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා සඳහන් කළේ මෙම නෞකා අනතුර හේතුවෙන් මෙරට මුහුදු තීරයට හා වෙරළ පරිසරයට සිදුවූ හානියට වන්දි වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 6.5ක වන්දි මුදලක් ලබාගැනීමට බළාපොරොත්තු වන බවයි. ඒ මූල්‍යමය වටිනාකමට සාධාරණ හේතු තිබෙන බවත් මෙම වන්දි මුදල අපේ රටේ ජනතාවගේ අයිතිවාසිකමක් බැවින් ඒ අයිතිවාසිකම් අපි දිනාගත යුතුයැයිද රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

මෙම අනතුර සම්බන්ධයෙන් මේ වනවිට අපේ රටේ අධිකරණයේ නඩු පවරා තිබේ. එමෙන්ම සිංගප්පූරුවෙත් නඩු පවරන්න බළාපොරොත්තු වෙනවා. සිංගප්පූරුවෙදි නඩු පවරන්නේ පරිසර හානිය සම්බන්ධයෙන්ය. ඒ පිළිබඳ අවශ්‍ය මැදිහත්වීම් අධිකරණ අමාත්‍යංශය හා නීතිපති දෙපාර්තමේන්තුව සිදුකරමින් තිබේ.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිනි නීතීඥ දර්ශනී ළහඳපුර මහත්මිය සඳහන් කළේ නැව ගොඩ ගැනීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති බවයි.. සාගරය යහපත් වුනොත් තව මාස දෙකතුනක් ඇතුළත නැව ගොඩ ගන්න පුළුවන් වේවි යැයිද ඇය සඳහන් කළාය.

මේ අතර එම්.වී එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරෙන් මෙරට සාගර පරිසරයට වූ හානියට අදාළ වන්දි මුදල නැව අයිති රක්ෂණ සමාගමෙන් ඇමරිකානු ඩොලර්-වලින් ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් අමාත්‍ය මණ්-ඩලයට ඉදිරිපත් කළ යෝජනාවට අනුමැතිය හිමිව තිබේ.

මීට අමතරව ඉදිරියේ දි මෙවැනි අනතුරක් සිදුවුවහොත් එම අවස්ථා වලදී ද වෙරළ පිරිසිදු කිරීම, අපද්‍රව්‍ය කළමණාකරණය, පරිසර හානි ආදි සියලුම කටයුතු වලට ලැබෙන ප්‍රතිපූර්ණ සහ වන්දි ඇමෙරිකා-නු ඩොලර් වලින් ලබා ගැනීමට ද කැබිනට් අනුමැතිය හිමි ව තිබේ.













නාලක සංජීව දහනායක

# ඉදිකිරීම් කර්මාන්තකරුවන්ට ලබාදීමට නියමිත හිඟ බිල්පත් කඩිනමින් ගෙවීමට පියවර



නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය අපේ රටේ තිබෙන විශාලතම හා ප්‍රධානතම අමාත්‍යාංශයක්. ඒ හරහා මේ වනවිට දිවයින පුරා විවිධ සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් පවතිනවා. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පසුගිය මාස කිහිපය තුළ හඳුන්වාදුන් වැඩසටහන් මෙම වසරේදී අපි නව සැලැස්මකින් ක්‍රියාත්මක කරමින් සිටිනවා. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන පසුගිය වසර කිහිපය තුළදී සිදු කළ කාර්යය භාර්යයන් මේ වනවිට නැවත සමාලෝචනයකට ලක් කිරීම ආරම්භ කර තිබෙනවා.

නව සංවිධාන ව්‍යුහයක් තුළින් ඒ ඒ ආයතනය එක් එක් අනපනත් සහ ඔවුන්ගේ විෂය සීමාවන් ඔස්සේ ඉටු කළ යුතු රාජකාරී මොනවද යන්න හඳුනා ගෙන ඉටු කළ යුතු දේ හා අරමුණු මොනවාද යන්න පිළිබඳ අප අවධානයට යොමු කළා. වැඩි ප්‍රතිඵල ලබා ගැනීමට ආයතනවල කාර්ය මණ්ඩලය ඒ සඳහා උනන්දු කරනමින් සිටිනවා. මේ කාලවකවානුවේ දී නව දැක්මක් ඔස්සේ අමාත්‍යාංශය ක්‍රියාත්මක වනවා.

## "ආයතන කාර්යභාර්යය නැවත සමාලෝචනයට"

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ආයතන 21 ක් තිබෙනවා. එමඟින් මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට කැපවී සිටිනවා. පසුගිය නොවැම්බර් මාසයේදී 2023 අයවැය ප්‍රකාශයට පත් කර අයවැය සම්මත කර ගන්න අවස්ථාවේදී විශේෂ ක්ෂේත්‍රයන් තුනක් ඔස්සේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙන්නට සැලසුම් කළා. ඒ අනුව,

01 - නාගරික සංවර්ධන අංශය
02 - නිවාස අංශය
03 - අපද්‍රව්‍ය කළමනාකරණය

යන ප්‍රධාන ක්ෂේත්‍ර තුන ඔස්සේ අමාත්‍යාංශය ක්‍රියාත්මක වනවා.

ඒ හැරුණාම මේ අංශ තුනට අයත් සියළුම ආයතනවල කළමනාකාරීත්වය සහ ඔවුන් කරන වැඩසටහන් සමාලෝචනය කරමින් ආයතනය ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව වෙනම අධීක්ෂණයක් සිදු කරනවා.

ප්‍රතිපත්ති හඳුන්වා දීම අමාත්‍යාංශයේ ප්‍රධාන රාජකාරීයයි. ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ආයතනවල අරමුණු වලට ගැලපෙන ක්‍රියාකාරී සැලැස්මක් අපි මේ වෙනකොට සකස් කර අවසන් කර තිබෙනවා.

එම සැලසුමට අනුව 2023 වසරේ ආයතන කරනු ලබන වැඩසටහන් අධීක්ෂණයට ලක් කරමින් වාර්ෂික හා අර්ධ වාර්ෂික වශයෙන් එම ප්‍රතිඵල සමාලෝචනයටත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

එම කටයුතු සිදු කිරීමේදී ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ ඒවා අගය කිරීමේදී ආයතන කොතරම් දුරට ඒ කාර්යය සාධනය ඉහළ මට්ටමකට පැමිණ තිබෙනවාද, ඒ කටයුතු ඉෂ්ඨ කර තිබෙනවාද කියා අපි විශේෂයෙන්ම සලකා බලනවා. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ඒ සඳහා අවශ්‍ය උපදෙස් නිරන්තරයෙන් ලබා දෙනවා.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරිය විශාල වැඩ කොටසක් සිදු කරනවා. 2022 වසරේ දෙසැම්බර් 31 වන දින අවසන් වීමට පෙර නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් සමස්ථයක් ලෙස හඳුනා ගන්නට අවශ්‍ය කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් විෂයභාර අමාත්‍යවරයා විසින් අපට ලබා දුන්නා.

ඒ උපදෙස් පරිදි මා නාගරික සංවර්ධන අධිකාරිය සතු දිවයින පුරා ඇති සියළු ඉඩම් හඳුනා ගැනීමට ඉඩම් බැංකුවක් නිර්මාණය කළා. එහි සියලු තොරතුරු මා වෙත ලැබී තිබෙනවා. එම ඉඩම් රටේ සංවර්ධනයට දායක කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් නව වැඩපිළිවෙලක් මේ වනවිට ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ තුළින් රටේ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට අමාත්‍යාංශයක් ලෙස දායකවිය හැකි නව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙනවා. ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සහ අමාත්‍ය මණ්ඩලය ලබා දෙන උපදෙස් අනුව මේ ඉඩම් සියල්ල උසස් මට්ටමකින් ප්‍රතිපල ලබා දෙන ඉඩම් බවට පත් කරන්නත් ඒ තුළින් ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන්නත් කටයුතු කරනවා. ඒ හරහා එම ඉඩම්වල ආයෝජනය කරන්නට විදේශීය ආයෝජකයින්ට අවස්ථාව ලබා දීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතිනවා.

මෙම කටයුතු සිදු කිරීමට නව සැලසුම් සහ තිබුණ සැලසුම් නවීකරණයකින් නව මානයක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට විෂයභාර අමාත්‍යතුමන් නිරන්තරයෙන් උපදෙස් ලබා දෙනවා. රාජ්‍ය අමාත්‍යවරුන් දෙපළ එය ක්‍රියාත්මක කිරීම සිදු කරනවා. ලේකම්වරයා ලෙස මා ආයතන ප්‍රධානීන් එක්ක ඒ කටයුත්තට නායකත්වය ලබා දෙනවා.



**ඩබ්.එස්. සත්‍යානන්ද මහතා**
**ලේකම්**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව විශාල වශයෙන් රට තුළ අත්හැරුණ ඉඩම් එනම් ප්‍රයෝජනයට ගත නොහැකි ඉඩම් වඩා සශ්‍රීක ඵලදායි ඉඩම් බවට පත් කරන්නට විශාල වැඩ කොටසක් කරනවා. කොළඹ නගරය කේන්ද්‍ර කරගෙන ගංවතුර පාලනය හා අනෙකුත් නගරවල ගංවතුර පාලනයට විශාල වැඩ කොටසක් කරනවා. පසුගිය වසර දෙක තුන තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් වල යම් යම් අඩුපාඩු තිබුණා. ඒ අඩුපාඩු සම්පූර්ණ කිරීම අපේ ප්‍රධාන වගකීමක් බවට පත්වෙලා තිබෙන්නේ. ක්‍රියාත්මක කළ වැඩසටහන් රැසක අවසාන ප්‍රතිඵලය ජනතාවට සහ රජයට ලැබෙන්න තිබුණ අවස්ථා මග හැරී තිබෙනවා. ඒවා පසුගිය කාලයේ පැවැති ප්‍රගති සමාලෝචන වලදී හඳුනාගෙන තිබෙනවා.

පසුගිය මාස දෙක තුන තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුරට හේතු වූ කාරණා මේ වනවිට හඳුනාගෙන තිබෙනවා. අධිවේගී මාර්ගය තැනීමෙන් අවහිර වූ මාර්ග ඇල මාර්ග හේතුවෙන් ගංවතුර ඇති වුණා. එය නැවත තිබූ තත්ත්වයට පිළිසකර කර ජල ගැල්මක් ඇතිවූ වහාම ජනතාව පීඩාවට පත් නොවන පරිදි ඒ කටයුතු සිදු කිරීමට අපට පුළුවන් කමක් ලැබිලා තිබෙනවා. ඒ සියළු කටයුතු දෙසැම්බර් 31 පෙර අවසන් කර සියළු ගෙවීම් කටයුතු සිදු කර අවසන් කළා. ඒ වෙනුවෙන් ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාව විශාල දායකත්වයක් ලබා දුන්නා.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පසුගිය වසර කිහිපය තුළ දිවයින පුරාම විවිධ ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා. එසේ ආරම්භ කළ නිම නොවූ ව්‍යාපෘති නිසා ජනතාව පීඩාවට ලක්ව තිබෙනවා.

2023 අයවැය තුළින් වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ආරම්භ කළ නිම නොවූ ව්‍යාපෘති ඉක්මනින් නිම කර ජනතාවට අවශ්‍ය සහනය සලසා දෙන්නැයි ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් අපට උපදෙස් ලබා දී තිබෙනවා.

## "නව ව්‍යාපෘති වෙනුවට නිම නොකළ ව්‍යාපෘති නිම කිරීමට පියවර"

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නව අධ්‍යක්ෂක මණ්ඩලයක් සමඟ ජනවාරි මාසයේ නව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න අමාත්‍යතුමා උපදෙස් ලබා දී තිබෙනවා. ඒ අනුව විශේෂයෙන්ම දිවයින පුරා විසිරී සිටින ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුළු, මධ්‍ය හා මහා පරිමාණ සියළුම කර්මාන්තකරුවන් වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න වැඩපිළිවෙලක් නිර්මාණය කර තිබෙනවා. ඒ අනුව ඔවුන්ට අවශ්‍යවන මූල්‍යමය උපදෙස් වගේම ඒ අයට අවශ්‍ය මානසික උපදෙස් ලබා දීමට අප කටයුතු කරනවා. බැංකු ණය ගෙවා ගන්න බැරිව ඔවුන් මේ වෙලාවේ අසරණ වෙලා ඉන්නේ.

පසුගිය අවුරුදු කිහිපයේ ඔවුන්ට ලබා දීමට නියමිත හිඟ බිල්පත් ගෙවන්න මූලික අවධානය යොමු කර තිබෙනවා. මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් අනුව ඒවා කොටස් වශයෙන් ගෙවීමට අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුකර අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කර්මාන්ත කරුවන් රැක ගැනීම සඳහා කටයුතු කරනු ලබනවා. ඔවුන්ට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා ලබා දෙන්නත්, ආසන්න රටවල්වල තිබෙන ව්‍යාපෘති සඳහා ඔවුන්ව යොමු කිරීමට අවශ්‍ය වන විදේශ ප්‍රතිපත්ති පවා සංශෝධනය කිරීමට අවශ්‍ය සාකච්ඡා සිදු වෙමින් පවතිනවා. ඒ යටතේ ඔවුන්ට පුළුවන් වේවි තමන්ගේ යන්ත්‍ර සූත්‍ර තමන්ගේ ශිල්පීය නිපුණතාවයන් තියෙන නිලධාරීන් ඒ සඳහා යොමු කරන්න. ඒ තුළින් විදේශ විනිමය ගෙන ඒමට හැකිවනවා සේම ඔවුන්ගේ කර්මාන්තය රැක ගන්නත් හැකි වෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ ලක්ෂ 13 කට ආසන්න සේවක පිරිසක් පීඩනයට පත් ව ඇති බවට තොරතුරු ලැබී තිබෙනවා. සුපුරුදු කර්මාන්තයෙන් බැහැරව වෙනත් කර්මාන්තයකින් හෝ වෙනත් ආයෝජන මාර්ගයකට ඒ සම්පත් භාවිතා කර වෙනත් කර්මාන්ත සඳහා යොමු කිරීමටත් අවධානය යොමුව තිබෙනවා.

## "ඉදිකිරීම් කර්මාන්තකරුවන් රැක බලා නොගත්තොත් අභියෝග රැසකට මුහුණ දීමට සිදුවනවා"

සුළු, මධ්‍ය හා මහා පරිමාණ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් මේ වෙලාවේ රැක බලා ගැනීමට නොහැකි වුවොත් වසර දෙක තුනක් තුළ විශාල අභියෝගයකට මුහුණ දීමට සිදුවෙනවා. 2023 වර්ෂයේ පසුගිය වසර දෙක තුනක කාලය තුළ සිදු වූ අඩු පාඩු මගහරවා ගනිමින් අභියෝග ජය ගන්නත්, අමාත්‍යතුමාගේ දර්ශනය අනුව රාජ්‍ය අමාත්‍යවරුන්ගේ මැදිහත්වීම මත ලේකම්වරයා ලෙස මම සහ අපේ ආයතන ප්‍රධානීන් සියල්ල කණ්ඩායමක් ලෙස කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබේවි. 2023 මේ ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් කරන්න කටයුතු කරනවා. ඉදිරි වසරවල අපේ සංවර්ධන වැඩසටහන්වල පදනම ලෙස 2023 වර්ෂය සකස් කිරීමට මූලික කටයුතු මේ අවස්ථාවේ සිදු කර අවසන්.

අමිල දර්ශන හේරත්



# මනුස්සකම

ලංකාවේ ජනගහනය කෝටි දෙකකට ටිකක් වැඩිය. හරියටම කිව්වොත් එක්සත් ජාතීන් ගේ දත්තවලට අනුව 2022 දෙසැම්බර් 19 වන සඳුදා වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය 21,633,815 කි. එසේනම් අප තනි තනිව ගත්විට මේ 21,633,815 න් එකෙකි. මා නැතත් මේ රටේ තව 21,633,814 ක් සිටී.
එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් මෑතක දී නිකුත් කරන ලද ප්‍රක්ෂේපනවලට අනුව 2022 අවසන් වනවිට ලෝක ජනගහනය බිලියන 8 ඉක්මවා ඇත. එසේනම් අප තනිව ගත්විට බිලියන අටෙන් එකෙකි.

ඉතින් මේ බිලියන අටෙන් එක්කෙනෙක් නැති වුනොත් එදාට ලෝක විනාශය සිදු වෙයිද? නැත. ලෝකය සාමාන්‍ය පරිදිම පවතිනු ඇත. තනතුරෙන්, ධනයෙන්, බලයෙන්, උගත්කමින් ආදී වශයෙන් සැලකූ විට එක්කෙනෙක් තව කෙනෙක් ඉක්මවා ඉහළ තනතුරක සිටිනවා විය හැක, ධනය උපයාගෙන තිබෙනවා විය හැක, අධ්‍යාපන සුදුසුකම් ලබාගෙන තිබෙනවා විය හැක. එහෙත් යම් එක තනතුරක් ගත්තොත් මේ මහා විශාල ලෝකයේ ඒ එක තනතුර දැරිය හැක්කේ එක් අයකුටම පමණ ද? ඒ එක තනතුර දැරීමට අවශ්‍ය සුදුසුකම් ලබාගත හැක්කේ එක් අයකුටම පමණ ද? නැත. කිසිවකු එතරම් සුවිශේෂී නැත. මේ ලෝකය ඇති වූ දා සිට අද දක්වා කිසිවකු අමරණීයව සිටියේ නැත. එසේ කිසිවකු අමරණීය නොවූවාය කියා එය ලෝකයේ පැවැත්මට බාධාවක් වුයේද නැත. එසේනම් ඉදිරියට වන්නේ ද නැත. ඔබ සිටියත් නැතත්, මා සිටියත් නැතත්... හෙටද ඉර පායනු ඇත. මේ ලෝකය පවතිනු ඇත.
මේ අප තේරුම් ගත යුතු යථාර්තය යි.

ඔබ හෝ මා නොමැතිව වුවත් ලෝකය පවතිනවා වුවද ඔබ හෝ මා ජීවත්ව සිටින තාක් අපට තනිව ජීවත් විය හැකිද? "තනිවයි උපන්නේ.. තනිවයි මැරෙන්නේ..." කීවාට ජීවත් වෙද්දී නම් කිසිවකුට තනිව ජීවත් විය නොහැක. ළදරු වියේදී මව මත යැපෙන අතර, ක්‍රමක්‍රමයෙන් වැඩෙද්දී අවස්ථානුකූලව අන් අය මත යැපීම සිදුවේ. මෙතෙක් ජීවත් වී ඇති වසර ගණන සමඟ සිතා බැලුවහොත් අපට කොතෙක් නම් අන් අයගේ සහාය ලැබී ඇත්ද? ගුරු වෘත්තියේ එක් එක් විෂයයන්හි ප්‍රවීණ වූවන් විසින් අපට ඒ ඒ විෂය කරුණු උගන්වා ඇත. වෛද්‍ය වෘත්තියේ එක් එක් අංශයන්හි ප්‍රවීණ වූවන් විසින් ඒ ඒ අවස්ථාවල ඇතිවූ රෝගයන්ට ප්‍රතිකාර කර ඇත. යම් විෂයක් ඉගෙනගෙන තිබීම හෝ යම් තනතුරක් දැරීම, මේ ලෝකයට වැදගත් වන්නේ තමන් පමණකැයි කියා සිතීමට කාරණයක් නොවේ. තමන් මේ ලෝකයේ බිලියන ගණනක් වන මිනිසුන් අතරින් එක අයකු පමණක් බව දැනගෙන ජීවත් වීම සෑහේ. වැදගත් වන්නේ නිහතමානී වීමයි. ගරු කළ යුත්තේ මනුස්සකමයි.

**තිලිණි සුරංගිකා කරස්නාගොඩ**
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

# හද ඇඳි රේඛා

කියන්නට හැකි නම් ඇයට
පවසයි හඬනගා ලොවට
කොතරම් වේදනාවක්ද ගතට
තම ළයමඩල ගිනිගත් විට

ආවේ ඔහු යන්න ඇ ළඟින්
රෑ දැක නැවතුණා ඇ අසලින්
ලියන්නට පිටුවක් ඉතිරි කරමින්
මිය ගියා ඔහු සෙමින් සෙමින්

ලොවේ පීවය ඇයයි
රටේ රැකුමද ඇයයි
උඩින් නිසසල අහසයි
ඇය නිසල මහ මුහුදයි

**(නිහාර චාමික පෙරේරා)**

දෑසක් බලා දෑසක් මොනවද කීවා...
ඒ පින් දෑස සංසාරෙම සිර කෙරුවා....
දහසක් දෑස් අනිමුව සිත ගොළු වූවා...
පෙර දුටු දෑස හමුවනතුරු තනි වූවා...

**(දිලි)**

## කඳුළු බිඳ

හිතේ දුකට සැනසීමක් වූ නුඹ
සතුටට සතුටක් වූ නුඹ
කිසිවක් කියාගත නොහැකිව
ගොලු වූ තැන... හේමලයෙකි
නුඹ මා හට

අප කාගෙත් නෙතු අග රැඳෙන,
දිළිසෙන තරු කැටයකි නුඹ...
දුක සතුට දෙකට ඉන්න,
කඳුළු බිඳ ලෙස නම් දැරූ නුඹ ...

**(ටී.එම්. ශිහාරා රශ්මි බංඩාර)**

## නිදහස

වහල් වූ විටෙක දැනෙන උසුලනා පීඩනයේ බර
කෙතෙක් ගලපම් ද වහල් බවේ නීරස ය......
දිනා දුන් පසු ලැබූ ඒ නිදහස
රැකගන්න වේ සොඳින් අත හැරෙයි යලි දිනෙක.....
පර ගැති ව පරසිරිත් ඉහ මුදුනේ ගත්ත උන්
ඔච්චම් කරයි හෙටත් පෙර පුරුදු විදිහටම
නිවට උන් ලෙසින් ලොවේ ජීවත්ව කුමකටද........
පුතේ උඹ දැන ගනින් නිදහසේ මහා අරුත
ඇස් ඉස් මස් ද නොව ජීවිතේ දන් දුන්නා
වතු පිටි ද ඉඩකඩම් අඹුදරුවෝ බිලි දුන්නා
මනුසත්කමේ ගුණ උන් පසක විසිකෙරුවා
රතු වන් වූ රුහිරයෙන්
මහ පොළොව තෙත් කෙරුවා
මව්බිමේ උරුම උන් මව්බිමේ වහලුන් ව
විඳින දුක් කියන්නේ කොයි ලෙසින් කාහටද........
හිමිව තිබූ හැමදේම අහිමි වෙයි ඇස් පිටම
සිහිකරමු නිදහසක් අපෙන් උදුරා ගත්ත
එන්න පෙරමුණට යළි එක්ව කොඩියක් යටට
සෙවණ ගෙන හැකි වුණොත්
එකම ලෙස නැගිටින්න
යළිත් හැකිවෙයි පුතේ රට පෙරට ගෙන යන්ට
ජාති කුල වලින් කලේ බෙදා වෙන් කිරීමයි
එහෙම අපි හිතුවාම යන්නේ පසුපසට මයි
එකම මවකගේ දරුවෝ එක වගේ හිතන්නයි
නිදහසේ අගය දැන උපන් රට දිනන්නයි

**පූජනී අප්සරා චන්ද්‍රරත්න - පූජී**

## හමු නොවන මතක...

නොසිතූ විලස මිහිදන් වුන,
මා හට දුන් නුඹෙ සෙනෙහේ
ප්‍රාර්ථනා පොදි බැඳගෙන,
මා ළඟ රැඳි නුඹෙ ප්‍රාණේ
යලි කිසිදින හමු නොවුනත්,
අපි මේ භව කතන්දරේ
හසරැලි පිරි නුඹෙ රුව හද,
සදා රැඳෙනු ඇත මතකේ

**(ධනුෂිකා කුමාරි)**

පුරුදු සුලගක් ඇවිත් වැදුනත්
නිතර යනෙනා මාවතේ......
මතකයන් විතරක්ම ඉතිරි ව
තවම ඇත ,
අප ආ ගිය මගේ....

ඉඳහිටකවත් ඇවිත් නුඹ
විමසුවත් සැප දුක අපේ
නොහඳුන සේ ඉන්නේ කොහොමද?
පෙම්වතුන් අප පෙර දිනේ....

ගියපු දා සිට මාව තනිකර
මතකයන් මං කඳු ගසා
එකතුකර මං මගේ තනියට
තබාගත්තා සගවලා...

තවම ඒ සිත නුබේ මත්තෙම
ආදරෙන් මං රඳවලා
බලා ඉන්නෙමි
මතු බවේ හෝ
මගේ වේ යැයි
හිත රවටලා....

- කවි-

# සුහද ක්‍රිකට් තරගාවලිය 2022 ඡායා රූප








නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය සංවිධානය කළ සුහඳ ක්‍රිකට් තරගාවලිය පසුගියදා බත්තරමුල්ල, පැලවත්ත බුද්ධදාස ක්‍රිඩංගණයේදී පැවැත්වුණි.

මේ සඳහා අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය, අමාත්‍ය කාර්යාලය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යන ආයතන වල මාධ්‍ය ඒකකවල කාන්තා හා පිරිමි කණ්ඩායම් සහභාගී වූහ.

(ඡායාරූප - නුවන් දිනේන්ද්‍ර)



පිරිමි ශූරතාවය
අමාත්‍ය කාර්යය මණ්ඩල කණ්ඩායම





කාන්තා ශූරතාවය
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි කණ්ඩායම















නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කළ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය නාරාහේන්පිට ශාලිකා ක්‍රීඩාංගණයේදී පසුගියදා පැවති අතර එහිදී නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස අංශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ශූරතාවය දිනාගත්තේය.
ජයග්‍රාහී කණ්ඩායම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් මහතා සමඟ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.







